**ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනය - 2015**

**-------------------------------------------------------------------**

ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනයේ 2015 ජුනි 17 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 ජුනි 17 දිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1999 අංක 36 දරන ජාතික ධීවර හා නාවික ඉංජිනේරු පනතේ 25 වන වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලැසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මත සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 ආයතනයේ කටයුතු අවසන් කිරීම

2014 සැප්තැම්බර් 07 දිනැති අංක 31 දරන ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය පනතේ අංක 01 හා 71 වගන්ති අනුව අදාළ අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරන ලද දිනය වූ 2015 ජුනි 17 දිනෙන් පසුව 1999 අංක 36 දරන ජාතික ධීවර හා නාවික ඉංජිනේරු පනත ඉවත් වූ අතර ආයතනයේ සියලු නිශ්චල හා චංචල දේපළ සහ එදිනට වූ සියලු බැරකම් සාගර විශ්වවිද්‍යාලයේ වත්කම් හා බැරකම් ලෙස පවරා තිබුණි.

## 1.5 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 ජුනි 17 දිනට ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01

(i) ප්‍රමිතයෙහි 21 (ඇ) ඡේදය ප්‍රකාරව, මූල්‍ය ප්‍රකාශන සමග ශුද්ධ වත්කම්/ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයක් ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) සමාලෝචිත ගිණුම් කාලපරිච්ඡේදය වූ 2015 ජුනි 17 දිනට අදාළ තොරතුරු සමග 2014 සම්පූර්ණ වර්ෂයට අදාළ තොරතුරු සන්සන්දනාත්මකව ඉදිරිපත් කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණද ප්‍රමිතියෙහි 66 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති සන්සන්දනාත්මක අගයන් සම්පූර්ණයෙන්ම සන්සන්දනාත්මක නැති බවට අවශ්‍ය හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි.

(ආ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07**

**-----------------------------------------------**

ප්‍රමිතයෙහි 47 වන ඡේදය ප්‍රකාරව, ඉක්මනින් වෙනස්වීම්වලින් යුක්තවන දේපල පිරියත හා උපකරණ සඳහා වාර්ෂික ප්‍රත්‍යාගණනයක් ද, සාධාරණ වටිනාකමේ සැලකිය යුතු නොවන තරමේ වෙනස්වීම් පමණක් තිබෙන දේපල පිරියත හා උපකරණ සඳහා වර්ෂ තුනකට හෝ පහකට වරක් ප්‍රත්‍යාගණනයක් කිරීම ප්‍රමාණවත් බව දක්වා තිබුණි. එහෙත් ගිණුම්වල දැක්වෙන ශුද්ධ අගය රු.421,275,044 ක් වූ ආයතනයේ දේපල පිරියත හා උපකරණ ආයතනය ආරම්භ කර තිබූ 1999 වර්ෂයේ සිටම ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.

(ඇ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 09**

**-----------------------------------------------**

ප්‍රමිතයෙහි 15 වන ඡේදය ප්‍රකාරව අවසාන තොග, පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වුවත් එසේ තොග ආගණනය කිරීමකින් තොරව ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති තොග වටිනාකම වූ රු.1,330,395 ක් සමාලෝචිත කාලපරිච්ඡේදය අවසානයට වූ තොග ලෙස දක්වා තිබුණි.

### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

**-------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත කාලපරිච්ඡේදය අවසානයට රජයේ ප්‍රාග්ධන ප්‍රදාන වටිනාකම රු. 608,764,884 ක් හා ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහනෙන් ලැබී තිබූ ප්‍රාග්ධන ප්‍රදාන රු.132,721,471ක් වූ අතර ඒවා නියෝජනය වූ ශුද්ධ වත්කම්වල වටිනාකම රු.421,275,043 ක් විය. එහෙත් එම වත්කම් ක්‍රමක්ෂය කර නොතිබුණු අතර ඒ සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්තියක් ද හඳුනාගෙන නොතිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර තිබූ ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූල නොවූ අවස්ථා පහත පරිදි විය.

(i) සේවා කාලය වසර 05 සම්පූර්ණ වූ සේවකයින් සඳහා පාරිතෝෂික වෙන්කිරීම් සිදුකර ඇති බව ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සඳහන් කර තිබුණ ද සේවා කාලය වසර 01 සිට පාරිතෝෂික සඳහා වෙන්කිරීම් සිදුකර තිබුණි.

(ii) මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති 1.8 යටතේ සඳහන් කර ඇති වත්කම් වර්ගීකරණයට අනුකූල වන පරිදි වත්කම් වර්ගීකරණයක් ගිණුම් සටහන් 9 යටතේ දක්වා නොතිබුණි.

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

**-----------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගිණුම් කාලපරිච්ඡේදය තුළ අත්පත් කර ගන්නා ලද ස්ථාවර වත්කම් සඳහා පමණක් ක්ෂය ප්‍රතිපාදනය කර තිබූ අතර අනෙකුත් වත්කම් සඳහා ක්ෂය ප්‍රතිපාදනය කර නොතිබුණි. ඒ හේතුවෙන් කාලපරිච්ඡේදයට අදාළ ක්ෂය රු. 23,540,737 ක් අඩුවෙන් හා ස්ථාවර වත්කම්වල ශුද්ධ අගය එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත කාලපරිච්ඡේදයට අදාළව සේවක පාරිතෝෂික සඳහා වෙන්කිරීම් සිදුකර නොතිබුණි.

(ඇ) 2013 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා ගෙවිය යුතු විගණන ගාස්තු වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශනවල වෙන් කිරීම් සිදු කර නොතිබුණි.

(ඈ) එකතුව රු.8,217,153ක් වූ උත්සව අත්තිකාරම් හා ආපදා ණය ශේෂ ජංගම වත්කම් යටතේ දැක්වීම වෙනුවට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ආයෝජන යටතේ දක්වා තිබුණි.

(ඉ) 2015 ජූනි 17 දිනට රු. 85,267,921 ක් වූ කෙරීගෙන යන වැඩවල වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ කෙරීගෙන යන වැඩ ලෙස දැක්වීම වෙනුවට දේපල, පිරියත හා උපකරණ යටතේ දක්වා තිබුණි.

### 2.2.4 අවිනිශ්චිත ගිණුම්

මූල්‍ය ප්‍රකාශනවල ජංගම වත්කම් යටතේ 2011 වර්ෂයේ සිට පැවත එන අවිනිශ්චිත ගිණුම් ශේෂය රු. 85,433 ක් සමාලෝචිත කාලපරිච්ඡේදය අවසාන වන විටද හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම්

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

| | ගිණුම් විෂයය | වටිනාකම<br>රු. | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|---|
| (i) | ලැබියයුතු තැන්පතු | 2,106,936 | තැන්පතු ලේඛන,<br>අත්තිකාරම් ලේඛන |
| (ii) | අත්තිකාරම් | 3,740,168 | |
| (iii) | ගෙවියයුතු රැඳවුම් | 2,118,644 | |

## 2.3 ලැබිය යුතු හා ගෙවියයුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2001 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා සිසුන් ගෙන් අයවිය යුතු එකතුව රු. 10,688,673 ක් වූ පාඨමාලා ගාස්තු අයකර ගැනීමකින් තොරව උපාධි සහතික ද ලබා දී තිබුණු බැවින් එම මුදල් අයකර ගත නොහැකි තත්ත්වයක පැවතුණු අතර 2016 ඔක්තෝබර් 06 දිනැති පාලක මණ්ඩල රැස්වීමේදී එම ගාස්තු කපාහැරීමට තීරණය කර තිබුණි.

(ආ) 2003 වර්ෂයේ සිට 2006 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාළව අයවිය යුතු රු.798,671 ක් වූ ශිෂ්‍ය නේවාසික ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර සිසුන් පාඨමාලා අවසන් කර පිටව ගොස් ඇති බැවින් එම මුදල් අයකර ගත නොහැකි තත්ත්වයක පැවතුණි. මීට අමතරව 2009 වර්ෂයේ සිට 2015 වර්ෂයේ සමාලෝචිත කාලපරිච්ඡේදය අවසානය දක්වා රු.2,861,183 ක් වූ ශිෂ්‍ය නේවාසිකාගාර ගාස්තු ද අය නොවී පැවතුණි.

(ඇ) සමාලෝචිත කාලපරිච්ඡේදය අවසානයට ගෙවිය යුතුව පැවති සේවක අර්ථසාධක අරමුදල් රු. 6,624,699 ක් නිරවුල් කර නොතිබුණි.

(ඇ) වර්ෂ දහයකට අධික කාලයක සිට නිලධාරීන් 06 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු. 191,464 ක් වූ සුනාමි ණය ශේෂය සමාලෝචිත කාලපරිච්ඡේදය තුළදී ද අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
| --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 570 හා 571(3) | තැන්පත් කල දින සිට වසර 02 ක් ඉක්මවා තිබූ එකතුව රු. 2,056,844 ක් වූ තැන්පතු සහ රු. 58,000 ක ශිෂ්‍ය නේවාසික තැන්පතු මුදල් රෙගුලාසි ප්‍රකාරව රාජ්‍ය ආදායමට ගැනීමට හෝ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 394 | 2012 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් පවතින අවලංගු කල චෙක්පත් 55 කට අදාළ එකතුව රු. 697,854 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 835(1) (ඇ) හා 2(ඇ) | මුදල් රෙගුලාසි ප්‍රකාරව අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අධිකාරි බලය, තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරුව හෝ එසේ නොවේ නම් අමාත්‍යාංශ ලේකම්වරයා වෙත තීරණයක් ගැනීම සඳහා යොමු කිරීමකින් තොරව ශිෂ්‍ය නේවාසිකාගාර 03 ක් බද්දට ගැනීම සඳහා බදු ගිවිසුම්වලට එළඹ ආපසු ලබා ගත හැකි අත්තිකාරම් රු. 1,708,500 ක් ගෙවා තිබුණි. |
| (ආ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ශුද්ධ වටිනාකම රු. 421,275,044 ක් වූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| (ඇ) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පිරිවැය රු. 31,211,625 ක් වූ පරිගණක, උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ ජුනි 17 දිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.6,173,788 ක ඌනතාවයක් වූ අතර ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.71,013,054 ක් විය. කෙසේ වුවද, ගිණුම් පිළියෙල කිරීම සඳහා පදනම් කර ගත් කාලපරිච්ඡේදයන්හි වූ අසමානතාවයන් හේතුවෙන් ඊට අදාළ මූල්‍ය කාර්යසාධනයේ ඇගයීමක් කළ නොහැකි විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

1999 අංක 36 දරන ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතන පනතට අනුව ධීවර කර්මාන්තයෙහි යෙදී සිටින හෝ යෙදීමට අදහස් කරන තැනැත්තන්ගේ තාක්ෂණික හා කළමනාකරණ දක්ෂතා දියුණු කිරීමේ කාර්යය සඳහා මෙම ආයතනය පිහිටුවා තිබුණි. කෙසේවෙතත්, පුහුණු පාඨමාලාවන් පැවැත්වීම හැරුණු කොට පනතේ දක්වා තිබූ පහත සඳහන් කාර්යයන් ඉටුකරලීම සඳහා වූ ක්‍රියාකාරකම් ඉටු කර නොතිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

(i) ජාතික සහ ජාත්‍යන්තර සංවිධානවල ආධාරය ඇතිව ධීවර සහ නාවික ඉංජිනේරු ක්ෂේත්‍රයේ අධ්‍යාපනය ගැන සාකච්ඡා සම්මන්ත්‍රණ, සමූහ සාකච්ඡා පැවැත්වීම සහ පැවැත්වීමට වැඩ පිළිවෙලවල් යෙදීම.

(ii) ධීවර සහ නාවික ඉංජිනේරු ශිල්පයේ අධ්‍යාපනය සහ ව්‍යාපෘති පුහුණු සම්බන්ධයෙන් පරීක්ෂණ, සමීක්ෂණ සහ විමර්ෂන පැවැත්වීම ප්‍රවර්ධනය කිරීම.

(iii) ආයතනයේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති ශ්‍රී ලංකාවේ හෝ විදේශවල ආයතන සමග ගුරුවරුන් හා ශිෂ්‍යයන් හුවමාරු කිරීම හෝ වෙනත් ක්‍රම මගින් සහයෝගයෙන් කටයුතු කිරීම.

(අ) ආයතනයේ ක්‍රියාකාරී සැලැස්ම හා තත්‍ය කාර්යසාධනය සම්බන්ධයෙන් වූ තොරතුරු 2015 වර්ෂයටම අදාළව ඉදිරිපත් කර තිබීම හේතුවෙන් සමාලෝචිත කාලපරිච්ඡේදය සඳහා වූ කාර්යසාධනය ඇගයීමට නොහැකි විය. කෙසේ වෙතත්, 2015 වර්ෂය සඳහා පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්මට අනුව ආයතනයට අයත් විද්‍යාල 08 මගින් පවත්වාගෙන යන ඩිප්ලෝමා හා සහතිකපත්‍ර පාඨමාලා සංඛ්‍යාව සහ ඒ සඳහා බඳවා ගන්නා ලද සිසුන් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| විද්‍යාලය | ඉලක්ක | | තත්‍ය | | ප්‍රතිශතය | |
|---|---|---|---|---|---|---|
| | පාඨමාලා ගණන | සිසුන් ගණන | පාඨමාලා ගණන | සිසුන් ගණන | පාඨමාලා | සිසුන් |
| තංගල්ල | 23 | 529 | 6 | 158 | 26 | 30 |
| මීගමුව | 14 | 420 | 4 | 66 | 28 | 15 |
| මට්ටක්කුලිය | 9 | 194 | 6 | 111 | 67 | 57 |
| මඩකලපුව | 16 | 807 | 3 | 49 | 19 | 6 |
| ගාල්ල | 12 | 255 | 3 | 42 | 25 | 16 |
| යාපනය | 08 | 275 | 3 | 36 | 38 | 13 |
| කළුතර | 09 | 140 | 2 | 20 | 33 | 14 |
| ත්‍රිකුණාමලය | 10 | 105 | 3 | 54 | 30 | 51 |
| | 101 | 2725 | 30 | 536 | 30 | 20 |

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය තුළ ඩිප්ලෝමා පාඨමාලා 06 ක් සහ සහතික පත්‍ර, ජංගම හා වෙනත් පාඨමාලා 26 ක් පවත්වා ගෙන යාමට සැලසුම් කර තිබුණු අතර ඒ සඳහා සිසුන් පිළිවෙලින් 367 ක් හා 2,358 ක් ලෙස සිසුන් 2,725 දෙනෙකු බඳවා ගැනීමට ඉලක්ක කර තිබුණි. කෙසේවෙතත්, සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ බඳවා ගෙන තිබුණේ පිළිවෙලින් සිසුන් 76 ක් හා 460 ක් ලෙස සිසුන් 536 දෙනෙකු පමණි.

ඒ අනුව පාඨමාලා සඳහා බඳවා ගන්නා ලද සිසුන් සංඛ්‍යාව පිළිවෙලින් සියයට 21 ක් හා සියයට 20 ක් වැනි ඉතා අඩු අගයක් ගෙන තිබුණි. තවද, එක් එක් විද්‍යාලවලට ඇතුළත් කරන ලද සිසුන්ගේ ප්‍රතිශතය සැලකීමේදී මට්ටක්කුලිය, ත්‍රිකුණාමලය හා තංගල්ල විද්‍යාලවල පිළිවෙලින් සියයට 57, සියයට 51 හා සියයට 30 ක් වුවද අනෙකුත් සියළුම විද්‍යාලවල සියයට 20 කටත් වඩා අඩු අගයක් ගෙන තිබුණි.

(ii) පාඨමාලා සඳහා බඳවාගෙන තිබූ ඉහත සිසුන් 536 අතුරින් පාඨමාලා නිම කිරීමට යෝජිත ශිෂ්‍ය සංඛ්‍යාව 459 ක් වුවද සිසුන් 120 ක් එනම් සියයට 26 ක් පාඨමාලා හැරගොස් තිබුණි.

(iii) සමස්තයක් ලෙස සැලකීමේදී ආයතනයට අයත් විද්‍යාල 08 මගින් පාඨමාලා 32 ක් ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණද එයින් පාඨමාලා 14 ක් හා සැලසුම් නොකරන ලද පාඨමාලා 03 ක් පමණක් පවත්වා තිබුණි. තවද, විද්‍යාල 07 ක ඩිප්ලෝමා පාඨමාලා ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණද මට්ටක්කුලිය හා කළුතර යන විද්‍යාලවල පමණක් පාඨමාලා ආරම්භ කර තිබූ බව නිරීක්ෂණය විය. ඒ අනුව, එක් එක් විද්‍යාලවල ආරම්භ කරන ලද පාඨමාලා වල ප්‍රතිශතය සැලසුම් කරන ලද සංඛ්‍යාව සමග සැසඳීමේදී මට්ටක්කුලිය විද්‍යාලය හැර අනෙකුත් සියළුම විද්‍යාලවල සියයට 40 ට වඩා අඩු අගයක් ගෙන තිබුණි.

(iv) පාඨමාලාවලට සිසුන් බඳවා ගැනීම සඳහා පුවත්පත් දැන්වීම් 2014 නොවැම්බර් හා දෙසැම්බර් මාසවල පලකර තිබුණද විද්‍යාල 08 හි සිසුන් බඳවා ගැනීම වර්ෂයේ විවිධ කාලයන්හි සිදුකර තිබුණි. විද්‍යාලවල එකම පාඨමාලාව සඳහා සිසුන් බඳවා ගැනීමද විවිධ දිනයන්හි සිදුකිරීම හේතුවෙන් බඳවා ගැනීම් හා විභාග පැවැත්වීම් සම්බන්ධයෙන් විද්‍යාල 08 හි ඒකාකාරී බවක් නොපවතින බව විගණනයේදී නිරීක්ෂණය විය.

සැලසුම් කළ පරිදි පාඨමාලා ආරම්භ කිරීමට හා සිසුන් බඳවා ගැනීමට නොහැකි වීමට පහත සඳහන් හේතු බලපා තිබුණු බව උපකුලපතිවරයා විසින් විගණනය වෙත දන්වා තිබුණි.

- සිසුන් හට අවශ්‍යවන පහසුකම් අවමවීම හා නොමැතිවීම
- සිසුන්ගෙන් ප්‍රමාණවත් තරම් පාඨමාලා සඳහා ඉල්ලුම්පත් නොලැබීම.
- පාඨමාලා ආරම්භ කිරීමට අවශ්‍ය උපදේශකවරුන් හා විද්‍යාල කථිකාචාර්යවරුන් නොමැතිවීම.
- සමහර පාඨමාලා බලාපොරොත්තු වූ කාලසීමාවන්හි අවසන් කිරීමට නොහැකි වීම. (මුහුදේ රළු ස්වභාවය නිසා කිමිදුම් කටයුතු කල් දැමීමට සිදුවීම හා උපදේශකවරුන්ගේ හිඟතාවය)
- නාවික ඉංජිනේරු සහ ඩෙක් නිලධාරී ඩිප්ලෝමා පාඨමාලා ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණද අදාළ මධ්‍යස්ථාන සඳහා ISO 9001: 2008 තත්ත්ව සහතිකය සහ නාවික අමාත්‍යාංශයේ ලියාපදිංචිය නොමැතිව 2015 වසරේ සිට ආරම්භ කිරීමට නොහැකි වීම.
- අවශ්‍ය මානව සම්පත් ඌනතාවය හේතුවෙන් මධ්‍යස්ථාන කීපයක් සඳහාම එකම උපදේශකයන්/විද්‍යාල කථිකාචාර්යවරුන් යොදවාගෙන පාඨමාලා සිදුකරනු ලබන බැවින් සියළුම මධ්‍යස්ථානවල එකවර පාඨමාලා ආරම්භ කිරීමට නොහැකි වීම.

(ආ) උපාධි පාඨමාලා

--------------------

සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ උපාධි පාඨමාලා සඳහා බඳවා ගත් සිසුන් සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) සමාලෝචිත කාලපරිච්ඡේදය තුළදී උපාධි පාඨමාලා 04 ක් වෙනුවෙන් සිසුන් 87 දෙනෙකු බඳවා ගෙන තිබුණු අතර පෙර වර්ෂයේ පාඨමාලා 03ක් සඳහා බඳවා ගත් සිසුන් 107 දෙනා සමග සැසඳීමේදී සියයට 23.4 ක අඩු වීමක් නිරීක්ෂණය විය.

(ii) සමාලෝචිත වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මට අනුව පාඨමාලා 05 ක් සඳහා සිසුන් 175 දෙනෙකු බඳවා ගැනීමට අපේක්ෂා කර තිබුණද බඳවා ගත හැකිව තිබුණේ සිසුන් 87 දෙනෙකු එනම් සියයට 50 ක් පමණි.

ලැබී තිබුණු අයදුම්පත් 250 කට ආසන්න ප්‍රමාණයක් අතුරින් තෝරා ගත් සිසුන් 150 දෙනෙකු සම්මුඛ පරීක්ෂණයට මුහුණ දුන් බවත් ඉන් 87 දෙනෙකු පමණක් පාඨමාලා සඳහා ලියාපදිංචි වී ඇති බවත් එබැවින් ඉලක්ක ගත සිසුන් ප්‍රමාණය බඳවා ගැනීමට නොහැකිවූ බවත් උපකුලපතිවරයා විසින් විගණනය වෙත දන්වා තිබුණි.

(ඇ) පාඨමාලා ප්‍රතීතනය

---------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) පාඨමාලා ප්‍රතීතනය කිරීම ඒ ඒ විද්‍යාල විසින් සිදු කරනු ලබන අතර සමාලෝචිත කාලපරිච්ඡේදය තුළදී පවත්වන ලද පාඨමාලා 14 න් ප්‍රතීතනය කර තිබුණේ පාඨමාලා 4 ක් පමණි.

(ii) මට්ටක්කුලිය විද්‍යාලයෙන් ලබා දී තිබූ තොරතුරුවලට අනුව, 2013 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා බඳවා ගත් සිසුන් සඳහා NVQ සහතික 32 ක් ලබා දී තිබුණි. කෙසේ වුවද, එම සිසුන් බඳවා ගැනීමේ දී සඳහන් කර තිබුණු NVQ 4 හා 5 වෙනුවට තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් පවත්වන ලද පරීක්ෂණයෙන් එම පාඨමාලා සඳහා NVQ 2 හා 3 ලබාදී තිබූ අතර ඒ හේතුවෙන් එම පාඨමාලාවල ගුණත්වය පහළ මට්ටමක පවතින බව විගණනයේදී නිරීක්ෂණය විය.

NVQ තත්ත්වය ලබාගැනීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් හා උපදේශකවරුන්ගේ හිඟය නිසා ප්‍රතීතන කටයුතු සිදු කිරීමට ප්‍රමාද වූ බවත් මේ වන විට NVQ 4,5 මට්ටමින් පාඨමාලා පැවැත්වීම ආරම්භකර ඇති බවත් උපකුලපතිවරයා විසින් විගණනයට දන්වා තිබුණි.

**(ඈ) පාඨමාලවලට සිසුන් බඳවා ගැනීම සඳහා වූ ප්‍රචාරණ වියදම්**

සමාලෝචිත වර්ෂයේ විවිධ පාඨමාලාවන් සඳහා සිසුන් බඳවා ගැනීම සඳහා පුවත් පත් දැන්වීම් හා රූපවාහිනී වැඩසටහන් සඳහා රු. 3,669,132 ක් වැයකර තිබුණ ද සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ උපාධි පාඨමාලා සඳහා සිසුන් 87 දෙනෙකු හා අනෙකුත් පාඨමාලා සඳහා සිසුන් 536 දෙනෙකු පමණක් බඳවා ගෙන තිබුණ බැවින් ප්‍රචාරණය සඳහා දරන ලද වියදමට සාපේක්ෂව ප්‍රමාණවත් ළමුන් සංඛ්‍යාවක් ඒ සඳහා ඉල්ලුම් කර නොතිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) තංගල්ලේ පිහිටි නේවාසිකාගාර දෙකක් සඳහා 2015 මාර්තු 15 දින සිට 2016 මාර්තු 14 දින දක්වා වූ කාලයට අදාළ බදු ඔප්පු ලියාපදිංචි කර නොතිබුණු අතර නේවාසිකාගාර බද්දට ගැනීම සඳහා ඇති කරගෙන තිබූ අනෙකුත් සියළුම ගිවිසුම්වලට සවිකිරීම් පිළිබඳ විස්තර ඇතුළත් කර නොතිබුණි.

(ii) මට්ටක්කුලියේ පිහිටි නේවාසිකාගාරය 2015 මාර්තු 18 දින ආපසු භාරදී තිබුණි. බදු ගිවිසුමේ 03 වගන්තිය අනුව, බදු කාලය අවසානයේ හිඟ බිල්පත් හා බදු දේපලට කිසියම් අලාභ හානියක් සිදුකර ඇත්නම් ඒ සඳහා ඇස්තමේන්තුකරුවකු ලවා ඇස්තමේන්තු කිරීමෙන් පසු එකී මුදල් අඩුකර මූලික තැන්පතුවේ ඉතිරි මුදල එකවර බදු දීමනාකරු විසින් බදු ගැනුම්කාර ආයතනය වෙත ලබාදිය යුතු බව දක්වා තිබුණි. එහෙත් බදු දීමනාකරුගේ අළුත්වැඩියා කිරීමේ තක්සේරුව රු.743,000 ක් හා විද්‍යාලයේ ඉංජිනේරුවරයාගේ තක්සේරුව රු. 162,250 ක් වූයෙන් විගණිත දිනය වූ 2017 මාර්තු 31 දින වන විටත් රු. 840,000 ක් වූ තැන්පතු අයකර ගැනීමට කළමනාකරණය විසින් විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 4.3 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 වර්ෂයේදී ආසියානු සංවර්ධන ආධාර යටතේ රු. මිලියන 45 ක් වැයකර යාපනය විද්‍යාලයේ නව තෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකර තිබූ අතර සමාලෝචිත වර්ෂය තුළ එහි සහතික පත්‍ර පාඨමාලා 08 ක් පැවැත්වීමට සැලසුම්කර සිසුන් 275 දෙනෙකු බඳවා ගැනීමට ඉලක්ක කර තිබුණි. එහෙත් පාඨමාලා 03 ක් පමණක් පවත්වා සිසුන් 36 දෙනෙක් වැනි අඩු ප්‍රමාණයක් ඇතුළත් කර ගෙන තිබුණි. තවද, මට්ටක්කුලිය හා ත්‍රිකුණාමලය හැර අනෙකුත් විද්‍යාලවල බඳවා ගන්නා ලද සිසුන් සංඛ්‍යාව සියයට 30 කට වඩා අඩු අගයක් ගෙන තිබීම හේතුවෙන් එම විද්‍යාලවල භෞතික සම්පත් ඌන උපයෝජිතව පවතින බව නිරීක්ෂණය විය.

(ආ) ප්‍රාදේශීය විද්‍යාල සඳහා පසුගිය වර්ෂයේදී ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහන යටතේ මිලදීගෙන තිබූ පුහුණු උපකරණ වලින් වටිනාකම රු.2,178,150 ක් වූ උපකරණ වර්ග 56 ක් 2016 අප්‍රේල් වන විටත් අදාළ ප්‍රාදේශීය විද්‍යාල වෙත බෙදාහැරීමට කටයුතු නොකර නිශ්කාර්යව පැවතුණි.

(ඇ) ආයතනය සතු වාහන 08 ක් දීර්ඝ කාලයක් තිස්සේ පාවිච්චියට ගත නොහැකි තත්ත්වයේ පැවතුණු අතර එම වාහන අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

## 4.4 විධිමත් පරිදි පවරා නොගත් ඉඩම් හා දේපල

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය ආරම්භයේ සිට පරිහරනය කරමින් පවතින ප්‍රධාන කාර්යාලය ඇතුළුව විද්‍යාල 08 ක ඉඩම් ගොඩනැගිලි හා අනෙකුත් වත්කම්වල අයිතිය ආයතනයට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර එම වත්කම් වැඩිදියුණු කිරීම සඳහා සමාලෝචිත කාලපරිච්ඡේදය අවසාන වනවිට රු.309,335,589 ක් වැය කර තිබුණි.

(ආ) ආයතනය විසින් භාවිතා කරන නාවික යාත්‍රා 07 ක් වැඩිදියුණු කිරීම වෙනුවෙන් සමාලෝචිත කාලපරිච්ඡේදය අවසානය දක්වා රු. 11,750,593 ක් වියදම් දරා තිබුණ ද, ඉන් නාවික යාත්‍රා 06 ක අයිතිය සහ ආයතනයේ වාහන ඇණිය තුළ ඇතුළත් වාහන 04 ක අයිතිය 2016 වර්ෂය අවසාන වනවිටද ආයතනයට පවරාගෙන නොතිබුණි.

## 4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරුවලට අනුව, 2015 ජූනි 17 දිනට ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය 286 ක් වූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය 210 ක් වූයෙන් පුරප්පාඩු 89 ක් විය. ආයතනයේ ඉහළ කළමනාකරණ තනතුරු වන අධ්‍යක්ෂ තනතුරු 04 ක් සහ කථිකාචාර්යවරු 08 දෙනෙක් ඇතුළුව විධායක මට්ටමේ නිලධාරීන් 20 දෙනෙකුගේ පුරප්පාඩු පැවතුනු අතර පහළ මට්ටම්වල නිලධාරීන් විසින් ආයතනයේ දෛනික කටයුතු ආවරණය කර තිබුණි. තවද අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා මුරකරුවන් 03 දෙනෙකු හා කම්කරුවන් 10 දෙනෙකු බඳවා යොදවා ගෙන තිබුණි.

(ආ) අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් නොවූ කපිතාන්වරයකු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීමකින් තොරව 2014 වර්ෂයේදී බඳවාගෙන මාසයකට රු.100,000 බැගින් 2015 ජනවාරි සිට ජූනි දක්වා රු.525,000 ක වැටුප් ගෙවා තිබුණි. තවද, එම පත්වීම සඳහා පුවත්පත් දැන්වීම් පළකර සුදුසු නිලධාරියකු තෝරා ගැනීමට කටයුතු කළයුතු බව 144 වන පාලක මණ්ඩල රැස්වීමේදී තීරණය කර තිබුණද ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි.

මෙම ආයතනයේ වෘත්තීය සහ උසස් අධ්‍යාපන අංශවල පාඨමාලා හදාරන සිසුන් සඳහා වෙළඳ නැව් සඳහා වූ අඛණ්ඩතා සහතිකය (CDC සහතික) ලබා ගැනීමට ISO 9001/2008 තත්ත්ව සහතිකය ආයතනය වෙත ලබා ගැනීම අනිවාර්යව තිබුණි. ඒ සඳහා නාවික ක්ෂේත්‍රයේ ප්‍රථම පන්තියේ නාවික නිලධාරියෙකු ආයතනය වෙත බඳවා ගැනීම අනිවාර්ය වී තිබුණු බවත් වෙළඳ හා නාවික දෙපාර්තමේන්තුවේ වාචික නිර්දේශ අනුව වැඩපැවරීමේ පදනම මත කපිතාන්වරයෙකු බඳවා ගැනීමට එවකට සිටි පාලන අධිකාරිය කටයුතු කළ බවත් උපකුලපතිවරයා විසින් මේ සම්බන්ධයෙන් විගණනයට දන්වා තිබුණි.

(ඇ) ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පිරවීමට කටයුතු කිරීමකින් තොරව සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ විධිමත් අනුමැතියකින් තොරව කොන්ත්‍රාත් හා තාවකාලික පදනම මත නිලධාරීන් 14 දෙනෙකු බඳවාගෙන 2015 ජනවාරි සිට ජුනි 17 දක්වා රු. 2,674,313 ක් වැටුප් ලෙස ගෙවා තිබුණි.

(ඈ) ආයතනය විසින් 2015 ජුනි 15 දින කළමනාකරණ සහකාරවරුන් 08 දෙනෙකු, කාර්යාල සහකාර සේවකයන් 06 දෙනෙකු සහ රියදුරෙකු බඳවාගෙන තිබුණද අනුමත බඳවා ගැනීමේ පටිපාටිය ප්‍රකාරව අයදුම්පත් කැඳවීම රජයේ ගැසට් පත්‍රයේ හෝ පුවත්පත් දැන්වීමක් මගින් සිදු කර නොතිබුණි. තවද, කළමනාකරණ සහකාර තනතුර සඳහා බඳවා ගැනීම ලිඛිත තරග විභාගයක ප්‍රතිඵල මත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සිදු කළ යුතු වුවද ඊට පටහැනිව ලිඛිත විභාගයක් නොපවත්වා එම නිලධාරීන් බඳවා ගෙන තිබුණි.

උක්ත සියළුම නිලධාරීන් එකම පළාතකින් පමණක් බඳවාගෙන තිබුණු බවට ඔවුන්ගේ ලිපිගොනු පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ බැවින් මෙම බඳවා ගැනීම අනුමත බඳවා ගැනීමේ විධිවිධානයන්ට පටහැනිව විනිවිද භාවයකින් හා විධිමත් භාවයකින් තොරව සිදුකර ඇති බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

(ඉ) පාලක සභාවේ අනුමැතිය මත 2009 වර්ෂයේදී ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනයේ නිලධාරීන්ගේ පත්වීම් දින පෙරදාතම් කර තිබූ නමුත් ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදය 1:10 ඡේදය පරිදි ඒ සඳහා අදාළ අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(ඊ) බඳවා ගැනීමේ පටිපාටිය අනුව, සහකාර ලේඛකාධිකාරී (ශිෂ්‍ය කටයුතු) තනතුරට ඉල්ලුම් කරන බාහිර අයදුම්කරුවන්ට අදාළ ක්ෂේත්‍රයේ වසර තුනක සේවා පළපුරුද්ද හෝ අභ්‍යන්තර වශයෙන් වසර 05ක පරිපාලන පළපුරුද්දක් තිබිය යුතු බව සඳහන් වෙතත් එම තනතුර සඳහා 2012 ඔක්තෝබර් 16 දින බඳවාගත් නිලධාරියාට එවැනි සේවා පළපුරුද්දක් නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
|---|---|
| (අ) ප්‍රසම්පාදනය | නේවාසිකාගාර සඳහා ගොඩනැගිලි බද්දට ලබා ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කර නොතිබීම. |
| (ආ) වත්කම් කළමනාකරණය | - වත්කම් නීත්‍යානුකූලව පවරා නොගැනීම. |
| | - උපකරණ බෙදා නොහැරීම හේතුවෙන් ඒවා නිශ්කාර්යව පැවතීම. |
| (ඇ) කාර්ය මණ්ඩල පරිපාලනය | - කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු සම්පූර්ණ නොකිරීම හා බඳවා ගැනීම් විනිවිද භාවයකින් හා විධිමත් භාවයකින් තොරවීම. |